**පැලියගොඩ නගර සභාව - 2020**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

පැලියගොඩ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.
1.2.1(ඇ),(ඉ), 1.2.2, 1.2.3,1.2.4, 1.2.5, 1.2.6(ආ), 2.2.3 හා 3.5(අ),

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක 18.7 හා LGD/10A/4/න.ශි./2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාරව සභාව සතු දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) අංක 6.11 පරිදි සමාලෝචිත වර්ෂය සඳහා දේපල පිරියත හා උපකරණ ක්ෂය කර නොතිබුණි. | 2021 වර්ෂයේ ප්‍රමිතිවලට අනුව කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා බාහිර ආයතනයවලින් ලැබූ හා ලැබිය යුතුව තිබුණු රු.15,009,300 ක ප්‍රාග්ධන ආධාර එසේ ගිණුම්ගත නොකොට පොදු තැන්පත් ගිණුම හරහා ප්‍රාග්ධන ආධාර ලැබීම් හා ගෙවීම් ගිණුම් ගත කොට තිබුණි. | 2021 වර්ෂයේ ප්‍රමිතිවලට අනුව කටයුතු කරන බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 3.2 යටතේ දැක්වෙන පරිදි පාරවල් සහ බෝක්කු සහ වෙනත් යටිතල පහසුකම් අයිතම් දේපල පිරියත අයිතම් දේපළ උපකරණ යටතේ ගිණුම්ගත කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු.16,056,292 ක් වැයකර සංවර්ධනය කර තිබූ පාරවල්, බෝක්කු හා කාණු ගිණුම් ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ප්‍රමිතිවලට අනුව කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | අංක 18.4 පරිදි 2020 ජනවාරි 01 දිනට වත්කම් හා වගකීම් ආරම්භක ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | වත්කම් හා වගකීම් ආරම්භක ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඊ) | අංක 3.5 අනුව සමාලෝචිත වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාවේ ස්ථාවර වත්කම් වර්ග 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත් වත්කම් 04 ක් යටතේ වර්ග කර තිබුණි. | 2021 වර්ෂයේ නිවැරදි වත්කම් කාණ්ඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

## 1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපළ පිරියත හා උපකරණ අයිතම සමුච්චිත ක්ෂය කිරීම් හා යම් ගිණුම්කරණ අලාභයක් අඩුකළ භෞතික පිරිවැයට මනිනු ලබන බවට හෙළිදරව් කර තිබුණද සභාවේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි. | ප්‍රත්‍යාගණනයක් සිදු කර නොමැතිවීම හේතුවෙන් ක්ෂය වෙන් කිරීම සිදුකිරීමට හැකියාවක් නොමැති වී ඇති බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුවේ |
| (ආ) | පරිගණක මෘදුකාංග වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත් බව හෙළිදරව් කර තිබුණද එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි වත්කම් කාණ්ඩයකට ඒකතු කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

## 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමෙන් ආදායමට දායක වීමේ ගිණුමේ ශේෂය රු.65,431,453 ක් සහ ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.26,891,063 ක් සංචිත අරමුදලකට බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සියලු ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂයන්ට හර නොකොට ස්ථාවර වත්කම්/කළ වැඩ ලෙස ගිණුම්ගත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දරා තිබුණු රු.3,597,865 ක ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂයන්ට හර කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට තිබූ ගිණුමේ ශේෂයන් හා ලේඛනගත ශේෂයන් සමඟ නොසැසඳෙන වටිනාකම රු.27.873,148 ක් වූ ගිණුම් 07 ක් ජ'නල් සටහන් අංක 49 මගින් හරටද, වටිනාකම රු.19,026,216 ක් වූ ගිණුම් 03 ක් ජ'නල් සටහන් අංක 50 මගින් බැරටද, සංචිත හා වෙන් කිරිම් ගිණුමට සටහන් කර තිබුණු අතර ලේඛන ශේෂය, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනවල සඳහන් ශේෂ සලකා ගිණුම් ගත කිරීම කර තිබුණි. | නොසැසදෙන ශෙෂයන් සංචිත හා වෙන්කිරීම් ගිණුමට ගලපා ලේඛන සමඟ ලේජර ශේෂයන් ගලපා ගන්නා ලෙස වැඩිදුරටත් උපදෙස් දී ඇති බව දන්වමි. | නිවැරදි ශේෂය හඳුනාගෙන ගැලපීම් කළ යුතුවේ. |
| (ඇ) | වර්ෂ 2015- 2020 කාලය තුළනිරවුල් කරන ලද රු.8,641,755 ක ණයහිමි ශේෂ 21 ක් හා අවලංගු කරන ලද ව්‍යාපෘති 4 ක් වෙනුවෙන් ණයහිමියන් වශයෙන් වෙන්කරන ලද රු.1,649,666 ක් වශයෙන් එකතුව රු.10,291,421 ක් වූ ණයහිමියන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සෘජු ප්‍රේෂණ ලෙස බැංකුවට ලැබී තිබූ වැටුප් ප්‍රතිපූර්ණ සහ සහික දීමනා ප්‍රතිපූර්ණ, බැංකු ප්‍රකාශය අනුව රු.45, 802,500 ක් වූ නමුත් පුනරාවරතන ආදායම් ආධාර ලෙස විස්තීර්ණ ආදායම් ගිණුමට ජ'නල් සටහන් 46 න් මාරුකර තිබූ වටිනාකම රු.64,689,250 ක් වූයෙන් ආදායම් ආධාර ලෙස රු.18,886,750 ක වටිනාකමක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ගිණුම් ගත කර නොතිබූ අතර ඉඩම් හා ගොඩනැගිලි යටතේ පෙරටු කාර්යාලය ඉදිකිරීමේ වියදම වූ රු.377,399 පමණක් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල දරන ලද ඉඩම් හා ගොඩනැගිලි වත්කමට එකතුකර දක්වන ලද බව දන්වමි. | මුළු වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 889,803 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව විගණනයට අවශ්‍ය විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වසරවල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 19,210,419 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 807,413 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 නිශ්කාර්ය වියදම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව පරිගණක මෘදුකාංග පද්ධතියක් 2019 පෙබරවාරි 01 දින සිට 2020 ජනවාරි 31 දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙතින් මිලදී ගැනීමට 2019 පෙබරවාරි 01 දින ගිවිසුම් ගතවී තිබුණි. සමාගම සමඟ ගිවිසුම්ගතවූ වසරක කාලය තුළ සභාවට ගැලපෙන පරිදි මෘදුකාංක පද්ධතිය වැඩි දියුණු කර ගැනීමට සම්බන්ධව අවධානය යොමුකර නොතිබූ අතර ගිවිසුම් කාලයද අවසන්වී මාස 9 ක් සම්පූර්ණ වූ වර්ෂ 2020 නොවැම්බර් 03 දින වන විට පද්ධතියෙහි අඩුපාඩු පවතින බව දැනුවත් කර 2020 ජනවාරි 31 දිනෙන් පසු ගිවිසුම අලුත් කිරිම ගැටළු සහගත බව දැනුම් දී තිබුණි.මෙම පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා රු.185,000 ක් වියදම් කර තිබියදී එය අත්හිටුවා වෙනත් පරිගණක මෘදුකාංග පද්ධතියක් යොදවා ගැනීමට තීරණය කර තිබීම නිසා ඉහත වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | වර්තමානයේදී මේ සඳහා වඩාත් කාර්යක්ෂම නෙක්ෆා ආයතනයේ මෘදුකාංගයක් සභාව විසින් භාවිතා කරනු ලැබේ. | සභාවට වාසිදායක අන්දමින් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. |